# ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය හා බැඳුණු විශේෂ භාෂා ව්‍යවහාර

**කුසුමලතා ලංකාමුල්ල**
සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
***kusumalathalanka@gmail.com***

ආහාර සංස්කෘතිය හා සූප ශාස්ත්‍රය අතර ඍජු සම්බන්ධයක් පවතී. සූප ශාස්ත්‍රය පැරණි සූ සැට කලාවන්ගෙන් එකකි. ආහාර සංස්කෘතියේ පිළිබිඹුව සූප ශාස්ත්‍රය යි. ත්‍රිපිටකය, සෙල්ලිපි සාහිත්‍යය, සම්භාව්‍ය සාහිත්‍ය කෘති, මහනුවර රජගෙදර සූපශාස්ත්‍ර පොත, ජන සාහිත්‍යය සහ ගැමියන් සතු ව සූප ශාස්ත්‍රය සම්බන්ධ භාෂා ව්‍යවහාර පවතියි. ලාංකේය ජන සමාජයෙහි විවිධ ස්තර, සංක්‍රාන්තිමය අවස්ථා, අභිචාර, ස්ථානීය සුවිශේෂතා ආදිය අතර ආහාර සංස්කෘතියේ විවිධ භාෂා ව්‍යවහාර රාශියක් පවතින බව පෙනේ.

වෙනස්වන ජීවන පැවැත්ම හමුවේ ආහාර හා බැඳුණු භාෂා ව්‍යවහාර අභාවයට යාම, ඒවා ඒකරාශී කිරීම, ආහාර සම්බන්ධ භාෂා අධ්‍යයන අවම වීම
ක්‍රමවේදය වශයෙන් සම්භාව්‍ය සාහිත්‍යය, ජන සාහිත්‍යය, සහ සම්මුඛ සාකච්ඡා ප්‍රමුඛ ව භාවිතයට ගැනේ.

ලාංකේය සංස්කෘතියෙහි ජීවිත සංක්‍රාන්ති අවස්ථාවලදී ප්‍රාදේශීය වශයෙන් විශේෂ භාෂා ව්‍යවහාර පවතියි. ඉඳුල් කටගෑම, වැඩිවිය පැමිණීම, විවාහය වැනි අවස්ථාවල ආහාර සංස්කෘතියෙහි විශේෂතාත් ඒ හා බැඳුණු භාෂා විධිත් ඇත.

ආහාර සංස්කෘතියත් සූපවිධිත් අතර සමීප සම්බන්ධතාව පවත්වාගනුයේ මුළුතැන්ගෙය ආශ්‍රයෙනි. මුළුතැන්ගේ බාර මුලාදෑනියා, සේවකයා, උපකරණ, ආහාර කල්තබා ගන්නා ස්ථාන ආදිය පිළිබඳ වෙනස් භාෂා ව්‍යවහාර විධි පවතී.

සූපවේදයේ දී ආහාර රසවත් කරගැනීම සඳහා සුවඳ වයිති, බැදි සුණු, සුවඳ පොඩි, සාත්තු සාඩම්බර, වට පැසි, කෙසර පැසි, අමු පැසි, මුං පැසි යන ව්‍යවහාරයෙන් යුතු ද්‍රව්‍ය යොදා ගෙන ඇති අතර ශරීර සෞඛ්‍යය සඳහා සම, මෘදු, බර යන විශේෂ ව්‍යවහාරයෙන් යුතු පාක ක්‍රමවලින් සකසා ගත් ආහාර ප්‍රයෝජනයට ගෙන තිබේ.

පන්සල, දේවාලය, කෝවිල, කමත, සංහිඳ ආදි ස්ථාන ආහාර සංස්කෘතියට ඍජු ව බද්ධ වෙයි. පන්සලේ දානයත් දේවාලයේ සහ කෝවිලේ මුරුතැන් බතත්, කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කමතෙහි ඇඹුල, වැදම, අලුමෝසුව ආදියත් සංහිඳේ අඩුක්කුවත් සත්කෝරළයෙහි සංහිඳට සම්බන්ධ රත් ඇඹුල, පුළුටු පහ, හත්මාළුව වැනි ආහාර සම්බන්ධ භාෂා ව්‍යවහාරත් ස්ථානීය සුවිශේෂතා පෙන්වයි.
සද්ධර්ම රත්නාවලිය, සද්ධර්මාලංකාරය වැනි සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවල ද ජන සාහිත්‍යයෙහි ද විශේෂයෙන් පොදු ජන ව්‍යවහාරයෙහි ද ආහාර සංස්කෘතිය හා සම්බන්ධ විශේෂ භාෂා විධි රාශියක් පවතියි.

***ප්‍රමුඛ පදඃ*** *ආහාර සංස්කෘතිය, සූප ශාස්ත්‍රය, භාෂා ව්‍යවහාරය, මුළු තැන්ගෙය, පාකක්‍රම*